# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2458/13 - 2025 ඔක්තෝබර් මස 13 වැනි සඳුදා - 2025.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25අ සහ 70ඇ වගන්ති සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ නියෝගය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සහ, ලියාපදිංචි අංකය පීවී 94112 දරන සහ අංක 03, ද ෆොන්සේකා පෙදෙස, කොළඹ 04 හි පිහිටා ඇති සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සම්බන්ධයෙන් ඉහත පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගෙන ඇති අතර එය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති අතර 2025 අප්‍රේල් 25 දිනැති සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද සහතිකය යටතේ එම සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස සංස්ථාගත කර ඇති අතර, මෙම නියෝගය මගින්, එම පනත යටතේ සාදන ලද නියෝගය සංශෝධනය කර, 2019 සැප්තැම්බර් 03 දින අංක 2139/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති අතර, එම නියෝගයේ "සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම" යන වචන දිස්වන ඕනෑම තැනක, "ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන ආදේශ කිරීමෙන් සහ ඉහත සඳහන් වගන්ති ප්‍රකාරව සාදන ලද ඕනෑම නියෝගයක, දැන්වීමක, කොන්ත්‍රාත්තුවක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනවල "ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන ආදේශ කිරීමෙන් කියවා අර්ථ නිරූපණය කළ යුතුය.

තවද, 2019 සැප්තැම්බර් 03 වන දින අංක 2139/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියෝගය මගින් පවරා ඇති ඕනෑම බලයක් අනුව, මෙම නියෝගය ක්‍රියාත්මක වන දිනට පෙර එම සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ඕනෑම බලයක් හෝ ඕනෑම රාජකාරියක් හෝ කාර්යයක් සියලු අරමුණු සඳහා ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වලංගු ලෙස ක්‍රියාත්මක කර ඇති බවට සලකනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0137


1A - PG 7286 - 283 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*